සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
தொழில்,தொழிற் சங்க உறவுகள் மற்றும் சமூகவலுவூட்டல்அமைச்சு
MINISTRY OF LABOUR,TRADE UNION RELATIONS AND SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/EER/2019

ඔබේ අංකය / உமது இல / Your No: .....

දිනය / திகதி / Date: 2019.06.20

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්

ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන - 2019

ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන සඳහා 2019 වසරේ ලැබී ඇති සීමා සහිත භාණ්ඩාගාර ප්‍රතිපාදන හේතුවෙන් වෙනත් වසරවල මෙන් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ව්‍යාපෘති හෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොමැති බව පළමුව ඔබ වෙත පෙන්වා දෙමි.

එසේ වුවද සමෘද්ධි බැංකු ණය හරහා ක්‍රියාත්මක ව්‍යාපෘති 50,000 ආදායම් උත්පාදන වැඩසටහන මේ වන විටත් ඔබ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන අතර සමෘද්ධි අපනයන නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන දිස්ත්‍රික්කයකට එක් ගම්මානයක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා වූ 2019/07 චක්‍රලේඛය ඔබේ අවධානය සඳහා සමෘද්ධි වෙබ් අඩවියට මේ වන විට ඇතුලත් කර ඇත.

මීට අමතරව මෙම අංශය යටතේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන හා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන සඳහා යම් සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් සෑම දිස්ත්‍රික්කයකටම ලබා දීමට අදහස් කර ඇති බැවින් පහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

1. සෑම දිස්ත්‍රික්කයකටම රු. 500,000/- ක ප්‍රතිපාදන ප්‍රමාණයකට අදාලව ජීවනෝපාය විශේෂ ව්‍යාපෘති යෝජනවක් ඉදිරිපත් කල හැකි වේ. එක් ප්‍රතිලාභියෙකු සඳහා ලබා දිය හැකි උපරිම ප්‍රතිපාදන සීමාව රු.45,000/- ක් වනු ඇත. මේ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර එවීම අත්‍යාවශ්‍ය වනු ඇත.

2. සෑම දිස්ත්‍රික්කයකටම රු. 500,000/- ක ප්‍රතිපාදන ප්‍රමාණයකට අදාලව ජීවනෝපාය සංවර්ධනයට ඉවහල්වන යටිතල පහසුකම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙමි. මේ යටතේ මාර්ග, වාරි මාර්ග, ජල සම්පාදන, ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල හැකි වේ. මේ සඳහා වූ ව්‍යාපෘති යෝජනාවක් ඇස්තමේන්තු මුදල, දෙපාර්තමේන්තු දායකත්වය, ප්‍රතිලාභි දායකත්වය, ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව ආදි විස්තරද දළ ඇස්තමේන්තු වාර්තාවක්ද සමඟින් මා වෙත ඉදිරිපත් කළ යුතු වේ. මේ සමඟ යෝජිත ව්‍යාපෘතියේ දැනට භෞතික තත්ත්වය පෙන්නුම් කරන ඡායාරූපයක්ද divinegumalh@yahoo.com ඊමේල් ලිපිනයට එවීමට කටයුතු කල යුතු වේ.

3. ඉහත ව්‍යාපෘති යෝජනා 2019.07.15 දිනට ප්‍රථම මා වෙත එවීමට කටයුතු කිරීම මැනවි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී. බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල் / பணிப்பாளர் தலைமையதிபதி / Director General
Tel- 011-2871672/2872202
Fax - 011-2889002
E-mail- dg@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director (Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
0112872202
Hot Line: 011- 2887722